සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

52 | S | I

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018
Third Term Test - Grade 13 - 2018

විභාග අංකය ................................. **නර්තනය (දේශීය) I** කාලය පැය දෙකයි

**වැදගත්**

අංක 1 සිට 25 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ වඩාත් පිළිතුර තෝරා ඊට අදාල අංකය ප්‍රශ්නය ඉදිරියෙහි ඇති වරහනෙහි යොදන්න.

❖ **උපදෙස්: මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 100 කි.**

01. නර්තන ශෛලීන්වල විවිධත්වය හඳුනා ගැනීමට ඉවහල්වන සාධක වන්නේ,
 1. රංග වස්ත්‍රාභරණ, වාද්‍ය භාණ්ඩ, සම්ප්‍රදායික රංග රචනය
 2. රංග වස්ත්‍රාභරණ, රංග වින්‍යාසය, බෙර පද හා ගායනය
 3. ආහාර්ය අභිනය, ආංගික අභිනය, වාචික අභිනය හා සාත්වික අභිනය
 4. ඇඳුම් පැළඳුම්, වාද්‍ය භාණ්ඩ, තාල රටා හා ගායනය
 5. වාද්‍ය භාණ්ඩ, බෙර පද, ගායන හා අංගහාර (........)

02. තෙල්මෙ නැටීම සහ වාහල නැටීම යන විශේෂ නර්තන අංග දෙක දැකිය හැක්කේ,
 1. උඩරට ගම් මඩුවේ ය. 2. සබරගමු ගම් මඩුවේ ය. 3. සබරගමු පහන් මඩුවේ ය.
 4. පහතරට දෙවොල් මඩුවේය. 5. සබරගමු දොවොල් මඩුවේ ය. (........)

03. කුජිං තත් // කුජිං තත් කුජිං තත් තත් මෙම පද කොටසින් ආරම්භ කොට නර්තනය කරනු ලබන්නේ,
 1. ආවැන්දුම 2. කොතල පදය 3. බුලත් පදය 4. අස්නෙ 5. යක් ඇනුම (........)

04. වඩිග පටුන, සූනියම් යාක්ෂණිය සහ ගුරුළු රාක්ෂ යන චරිත ඇතුළත් වන්නේ,
 1. රට යකුම, සන්නි යකුම සහ සූනියම් ශාන්තියෙහි ය.
 2. සූනියම් ශාන්තිය, සන්නි යකුම සහ කෝලම්හි ය.
 3. සොකරි, සන්නි යකුම සහ කුමාර සමයමයෙහි ය.
 4. රටයකුම, කෝලම් සහ සන්නි යකුමෙහි ය.
 5. සන්නි යකුම, කෝලම් සහ සූනියම් ශාන්තියෙහි ය. (........)

05. පහතරට ශාන්තිකර්ම පිළිබඳව මහාචාර්ය තිස්ස කාරියවසම් මහතා විසින් රචනා කරන ලද කෘති දෙකක් වන්නේ,

1. ශාන්ති කර්ම හා සිංහල සමාජය සහ රටයකුම් යාග විග්‍රහය ය.
2. රීරි යක් සංකල්පය සහ පහතරට ශාන්ති කර්ම සාහිත්‍යය ය.
3. ශාන්ති කර්ම සහ සිංහල සමාජය සහ කළු කුමාර සමයම ය.
4. රීරි යක් සංකල්පය සහ මහ සොහොන් සමයම ය.
5. සන්නි යකුම් යාග විග්‍රහය සහ කළු කුමාර සමයම ය. (........)

06. ජායිපූර්, ලක්නව්, රායිගර් සහ කථක් ගුරුකුල බිහි කිරීමෙහිලා පුරෝගාමී වූයේ,

1. අච්චන් මහාජාජ්, රාජා චක්‍රධාර් සිං, බිර්ජු මහාරාජ් ය.
2. මහරාජා සවායි ජායිසිං, රාජා චක්‍රධාර් සිං, නවාබ් වජිද් අලීසා ය.
3. රාජා චක්‍රවර්තී සිං, අච්චන් මහාරාජ්, ජානකී ප්‍රසාද් ය.
4. මහාරාජ්, ජායිසිං, අසාන් උද් දවුලා, රාජා චක්‍රධාර් සිං ය.
5. බිර්ජු මහාරාජ්, නවාබ් වජිද් අලීසා, බිර්ජු මහරාජ් ය. (........)

07. මහාචාර්ය ආරියරත්න කළුආරච්චි මහතා විසින් නිර්මාණය කරන ලද නවතම වන්නම් කිහිපයකි.

1. සමනල වන්නම, රතිරාග වන්නම, මණ්ඩුක වන්නම
2. ඇගලුම් වන්නම, සිරිකත වන්නම, තිසරා වන්නම
3. සමනල වන්නම, හංසා වන්නම, මහබෝ වන්නම
4. ඇගලුම් වන්නම, මන්තිරි වන්නම, ගුරු දේව වන්නම
5. මරගන වන්නම, මන්තිරි වන්නම, සේරා වන්නම (........)

08. එස්. පණීභාත, කේ.ඇස්. ප්‍රනාන්දු, ජී.වී.නිළමේ යන ශිල්පීන් ප්‍රවීණත්වය දැරූ නර්තන සම්ප්‍රදායන් අනුපිළිවෙලින්

1. උඩරට, පහතරට, කෝලම් 2. පහතරට, උඩරට, සබරගමු
3. සොකරි, සබරගමු, පහතරට 4. උඩරට, කෝලම්, සොකරි
5. උඩරට, පහතරට, සබරගමු (........)

09. ''විදෙන ලෙලෙන නරු බර පුළුලුකුල රැඳි ................. '' මෙම කවිය ඇතුළත් සංදේශය හා එය අයත් යුගය වන්නේ,

1. සැවුල් සංදේශය කෝට්ටේ යුගය 2. මයුර සංදේශය ගම්පල යුගය
3. ගිරා සංදේශය කෝට්ටේ යුගය 4. තිසර සංදේශය ගම්පල යුගය
5. සැලළිහිණි සංදේශය කෝට්ටේ යුගය (........)

10. කොහොඹා කංකාරියේ කොහොඹා දෙවිවරුන් තිදෙනාට අමතරව පුද ලබන දෙවිවරුන් තිදෙනෙකි.

1. ඉරුගල් බණ්ඩාර, කන්දේ බණ්ඩාර සහ දැඩිමුණ්ඩ දෙවියන්
2. ඉරුගල් බණ්ඩාර, කන්දේ බණ්ඩාර සහ වීරමුණ්ඩ දෙවියන්
3. මලේ බණ්ඩාර, ගලේ බණ්ඩාර සහ දැඩිමුණ්ඩ දෙවියන්
4. ඉරුගල් බණ්ඩාර, වැදි යකුන්ස හ මෙලෙයි යකුන්
5. රුප්පා යකුන්, මෙලෙයි යකුන් සහ දෙවොල් දෙවියන් (........)

11. පිළිවෙලින් භරත, මණිපුරි, කථකලි නර්තන සම්ප්‍රදායයන්වල ප්‍රවර්ධනයට දායක වූ ශිල්පීන් වන්නේ,

1. උදය ශංකර්, රුක්මණී දේවි අරුන්ඩේල්, ගෝපිනාථ ය.
2. රවීන්ද්‍රනාත් තාගෝර්, නවාබ් වජීද් අලීෂා, වල්ලතෝල් නාරායන මෙනන් ය.
3. මහා අක්බර්, උදය ශංකර්, චින්නයියා ය.
4. මීනාක්ෂි සුන්දර්ම් පිල්ලේ, රවීන්ද්‍රනාත් තාගෝර්, වල්ලතෝල් නාරායන මෙනන් ය.
5. වඩිවේළු, ධනංජනය, නවාබ් වජීද් අලීසා ය. (........)

12. දේශීය ශාන්ති කර්මයෙහි නාට්‍යමය අවස්ථා ගොඩ නැගීම සඳහා බහුලව යොදගෙන ඇත්තේ,

1. වාචික සහ ආංගික අභිනය ය.
2. වාචික සහ ආහාර්ය අභිනය ය.
3. සාත්වික සහ වාචික අභිනය ය.
4. ආහාර්ය සහ සාත්වික අභිනය ය.
5. සාත්වික සහ ආංගික අභිනය ය. (........)

13. දේශීය ජන සංගීතය හා බැඳුණු අවනද්ධ භාණ්ඩ වන්නේ,

1. ගැටබෙරය, තාලම්පට, දොවොල් බෙරය, දවුල
2. ගැටබෙරය, තම්මැට්ටම, දෙවොල් බෙරය, දවුල
3. උඩැක්කිය, රබාන, බුම්මැඩිය, ගැටබෙරය
4. දඬුබෙරය, රබාන, තාලම්පට, දවුල
5. ගැටබෙරය, තම්මැට්ටම, හොරණෑව, රබාන (........)


14. මුස්ලිම් ආභාසය සහිත රංග වස්ත්‍රාභරණ දැකිය හැකි වන්නේ,

1. ඇසැම් ප්‍රදේශයේ ප්‍රචලිත මණිපුරි නර්තනයෙහි ය.
2. ආන්ද්‍රා ප්‍රදේශයේ ප්‍රචලිත කුච්චිපුඩි නර්තනයෙහි ය.
3. කේරළ ප්‍රදේශයේ ප්‍රචලිත කථකලි නර්තනයෙහි ය.
4. මදුරාසියේ ප්‍රදේශයේ ප්‍රචලිත භරත නර්තනයෙහි ය.
5. දිල්ලියේ ප්‍රදේශයේ ප්‍රචලිත කථක් නර්තනයෙහි ය. (........)

15. ශාන්ති කර්මවල එන වාදන අවස්ථා සෙල ගත හැකි වන්නේ,

1. මඟුල් බෙර, අත්‍යා බෙර හා පහන් බෙර ය.
2. මඟුල් බෙර, අත්‍යා බෙර හා හේවිසි බෙර ය.
3. අත්‍යා බෙර, යහන් බෙර හා අණ බෙර ය.
4. අත්‍යා බෙර, යහන් බෙර හා තේවා වාදන ය.
5. මඟුල් බෙර, අත්‍යා බෙර හා යහන් බෙර ය.

(........)



16. ඉහත රූපයන්හි දැක්වෙන කෝලම් පිළිවෙලින් දක්වා ඇති වරණය වනුයේ,

1. දෙමළ, නාරිලතා, ආරච්චි, ජසයා
2. නොංචි, නාග කන්‍යා, අනබෙර, ජසයා
3. පුරන්සිනා, පංචනාරි සට, මුදලි, කාපිරි
4. ලෙංචිනා, අනංග භහිරව, ආරච්චි, පනික්කිල
5. නොංචි, සුරඹාවල්ලි, මුදලි, හෙන්වා (........)

17. ''ඉපල් පිටින් ගහන අච්ච පිටට ඉහිර වන්නේ ........ මෙහි

1. ලඝු 12 යි, ගුරු 05 යි, සැදැස්මත් 22 යි    2. ලඝු 10, ගුරු 04 යි, සැදැස්මත් 22 යි

3. ලඝු 12, ගුරු 06 යි, සැදැස්මත් 20 යි    4. ලඝු 10, ගුරු 05 යි, සැදැස්මත් 19 යි

5. ලඝු 08, ගුරු 04 යි, සැදැස්මත් 22 යි (........)

18. දක්ෂිණ භාරතීය භරත නාට්‍යයම් නර්තනයට යොදා ගන්නා සුවිශේෂී තත් භාණ්ඩ වන්නේ,

1. සිතාරය 2. වීණාව 3. එස්රාජය 4. තාම්පුරාව 5. පේනාව (........)

19. ''ජිංගත කුකුදත් ජිං ජිං - කුද ගත කුකුදත් ජිං ජිං ......... '' මෙය

1. බුලත් පදයේ කස්තිරමකි.    2. සුරපති වන්නමේ කස්තිරමකි.

3. අස්නෙ නර්තනයේ කස්තිරමකි.    4. ගොග් ගොග් ජී ජිංගත වට්ටමේ කස්තිරමකි.

5. කොතල පදයේ කස්තිරමකි. (........)

20. භාරතීය නර්තන සම්ප්‍රදායන්හි පෝෂණය සඳහා ඉවහල් වී ඇති ග්‍රන්ථ කිහිපයකි.

1. මහා භාරතය, භගවත් ගීතාව, අභිනය දර්පනය, සාකුන්තලය

2. මහා භාරතය, රාමායනය, ගීත ගෝවින්දය, ශිව පුරාණය

3. කාව්‍ය ශාස්ත්‍රය, නාට්‍ය ශාස්ත්‍රය, අභිනය දර්පනය, අමර කෝෂය

4. මහා භාරතය, රාමායනය, සාකුන්තලය, ගීත ගෝවින්දය

5. ශිව පුරාණය, විෂ්ණු පුරාණය, සීලප්පදිකාරම්, භගවත් ගීතාව (........)

21. පහතරට සින්දු වන්නම් රචනා කිරීමට අනුග්‍රහය සහ මූලිකත්වය ලබා දුන් අයෙකු ලෙස සැලකෙන්නේ,

1. මහනුවර ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා ය.    2. පොළොන්නරුවේ මහා පරාක්‍රමබාහු රජතුමා ය.

3. දඹදෙණියේ පණ්ඩිත පරාක්‍රමබාහු රජතුමා ය.    4. අනුරාධපුරයේ පඩුවස්දෙව් රජතුමා ය.

5. කෝට්ටේ හයවන පරාක්‍රමබාහු රජතුමා ය. (........)

22. 'තාල කාලා ක්‍රියාමානම්' යනුවෙන් තාලය පිළිබඳ අර්ථ දක්වා ඇත්තේ,

1. අමරසිංහ ආචාරීන් විසින් ලියන ලද අමර කෝෂයෙහි ය.

2. භරතමුණි විසින් ලියන ලද නාට්‍ය ශාස්ත්‍රයෙහි ය.

3. කාලිදාස විසින් ලියන ලද සාකුන්තලයෙහි ය.

4. අභිනව ගුප්ත විසින් ලියන ලද අභිනව දර්පනයෙහි ය.

5. ඇරිස්ටෝටල් විසින් ලියන ලද කාව්‍ය ශාස්ත්‍රයෙහි ය. (........)

23. ඉදිරියේ දී ඇති රූපයෙන් දැක්නේනේ,



1. දොවොල් මඩුවේ නාට්‍යමය පෙළපාලියකි.

2. කොහොඹා කංකාරියේ නාට්‍යමය පෙළපාලියකි.

3. රටයකුමේ නාට්‍යමය පෙළපාලියකි.

4. කෝලම් නාටකයේ අවස්ථාවකි.

5. සොකරි නාටකයේ අවස්ථාවකි.

(........)

24. දඹදෙණි යුගයේ නර්තන කලාව පිළිබඳ සාධක දැක්වෙන සාහිත්‍ය මූලාශ්‍ර වන්නේ,

1. දඹදෙණි අස්න, සද්ධර්ම රත්නාවලිය සහ උම්මග්ල ජාතකය

2. දඹදෙණි අස්න. කඳවුරු සිරිත සහ ථූප වංශය

3. දඹදෙණි අස්න, කඳවුරු සිරිත සහ මහා වංශය

4. සද්ධර්ම රත්නාවලිය. කඳවුරු සිරිත සහ දඹදෙණි අස්න

5. සද්ධර්ම රත්නාවලිය, උම්මග්ග ජාතකය සහ මහා වංශය (........)

25. ක්‍රිෂ්ණ ඇදහීම සහ ජන නාටක මූලික කොට ගෙන ප්‍රභවය වූ ඉන්දීය නර්තන සම්ප්‍රදායන් දෙකකි.

1. කුච්චිපුඩි සහ භරත 2. කථක් සහ කථකලි 3. භරත සහ කථක්

4. මණිපුරි සහ භරත 5. මණිපුරි සහ කථකලි (........)

◈ **26-35 තෙක් හිස්තැන්වලට අදාල පිළිතුර යොදා හිස්තැන් පුරවන්න,**

26. 'සිද්ධ මුනිඳු වැඩ හිඳ බෝ මුල විදුරාසන' මෙය ............................................... කවියකි.

27. මණිපුරි නර්තනයට භාවිතා කරන එකම තත් භාණ්ඩ ............................................ වේ.

28. සන්නියකුමේ එන සළු පාලිය නර්තන අංගය ........................................................ මහතා විසින් වේදිකාවට ගැලපෙන ලෙස සකස් කරන ලදී.

29. වේදිකාවේ රංගනය රචනා කිරීම ........................................... නම් වේ.

30. මිරිස්ස, උඩුපිල, මහ අම්බලන්ගොඩ යන ප්‍රදේශ .................................................. ජන නාටකය සඳහා විශේෂ ප්‍රසිද්ධියක් උසුලනු ලබයි.

31. ගැටබෙරය, දවුල සහ ............................................ සොකරි නාටකය සඳහා ප්‍රාදේශීය වශයෙන් යොදා ගන්නා වාද්‍ය භාණ්ඩ වේ.

32. ආමද්, ටුකඩා, සලාම් සහ තත්කාර් යන නර්තන අංග අයත් වන්නේ උත්තර භාරතීය ..................................... නර්තන සම්ප්‍රදායට ය.

33. ගැමි නැටුමක් ලෙස ප්‍රචලිත ............................................ එස් පණීභාරත මහතා විසින් වේදිකාවට නිර්මාණය කරන ලද්දකි.

34. ජෙහිං කුද තත් තත් තත් .....' මෙම අඩව්ව අයත් වන්නේ උඩරට .................................... වට්ටමට ය.

35. අත පය වෙවුල්ලා - හිස කට නිකට උල්ලා

දවුල උර එල්ලා - එය සබයට ගුරු මහල්ලා

මෙහි ගුරුමහල්ලා ලෙස හඳුන්වන්නේ කෝලම් වල එන .................................................... චරිතයයි.

◈ **36-50 තෙක් ප්‍රශ්නවලට අදාල පිළිතුරු තිත් ඉරමත ලියන්න.**

36. පහත සඳහන් ඇඳුම් කොටස් අයත් වන භාරතීය නර්තන සම්ප්‍රදායන් දෙක නම් කරන්න.

1. පිජාමා උඩෙයි ......................................................... 2. ඈශ්‍රෝරි ................................................................................

37. මයිකල් ෂෝකින් සහ මාරියස් පෙටීපා යන ශිල්පීණ් දෙදෙනා අයත් රටවල් මොනවාද?





1. මයිකල් ෂෝකින් .................................................. 2. මාරියස් පෙටීපා ................................................................

38. කොටවෙහෙර සුතිඝර චෛත්‍යයෙන් හමු වූ නර්තන ඉතිහාසය හා සම්බන්ධ සාධකය සහ එය අයත් යුගය ලියා දක්වන්න.

1. සාධකය ............................................................. 2. යුයග ...............................................................................

39. ' ඇත කඳුකර හිමව් අරණේ ................ ' මෙම ගීතය මුද්‍රා නාට්‍ය එහි නිර්මාතෘවරයා නම් කරන්න.

1. ......................................................................... 2. ...................................................................................

40. ඉහත රූපයන්හි දැක්වෙන ඉන්දීය වාද්‍ය භාණ්ඩ අතුරින් අවනද්ධ භාණ්ඩ දෙකක නම් කරන්න.

1. ......................................................................... 2. ...................................................................................

41. හතරවැනි රූපයෙන් දැක්වෙන තත් වාද්‍ය භාණ්ඩය නම් කරන්න.

1. වාද්‍ය භාණ්ඩය .................................................... 2. නර්තන සම්ප්‍රදාය ...............................................................

42. නිල් + කොළ සහ රතු + නිල් යන වර්ණ එකතුවීමෙන් සැදෙන ද්විතීයික අලෝක වර්ණ දෙක සඳහන් කරන්න.

1. ......................................................................... 2. ...................................................................................

43. ක්‍රිෂ්නාට්ටම් සහ රාමාට්ටම් යන නාටකයන්හි නිර්මාතෘන් වන්නේ,

1. ක්‍රිෂ්නාට්ටම් .......................................................... 2. රාමාට්ටම් ...............................................................................

44. විදුලි ආලෝකකරණයේදී භාවිතා වන වර්ණ කොටස් දෙකකි. ඒ මොනවාද?

1. වර්ණය ................................................................... 2. වර්ණය ..........................................................................

45. 'කපුයක්කාරිය සහ 'ගුරුගේ මාලාව' යන නාට්‍යමය පෙළපාලි ඇතුළත් ශාන්ති කර්ම දෙක නම් කරන්න.

1. කපුයක්කාරිය .................................................... 2. ගුරුගේ මාලාව .....................................................................

46. භරත නාට්‍යයම් සහ කථකලි හි ගුරුවරුන් හඳුන්වනු ලබන්නේ,

1. ......................................................................... සහ 2. ............................................................................ ලෙසය.

47. ශාන්ති දේවි ඝෝෂ් විසින් ලංකාවේදී නිෂ්පාදනය කරන ලද නෘත්‍ය නාටක දෙක නම් කරන්න.

1. ......................................................................... 2. ...................................................................................

48. කොට්ටේ සහ මහනුවර යන යුගයන් හි දී රජවරුන්ට සෙත් පතා කොහොඹා කංකාරි ශාන්ති කර්මය පැවැත් වූ බවට සාධක ඇතුළත් ග්‍රන්ථ දෙක සඳහන් කරන්න.

1. කෝට්ටේ යුගයේ රචිත ........................................ 2. මහනුවර යුගයේ රචිත ................................................

49. රංග වින්‍යාසයේදී අවකාශය බෙදා දක්වන ප්‍රධාන කොටස් දෙක ලියා දක්වන්න.

1. ......................................................................... 2. ...................................................................................

50. ''හඃ කී කට හඬින් දුර්ගඳ විහිද සැණෙකින් ..... '' මෙම කවි පදයෙන් මතුවන භාවය සහ රසය වන්නේ, මෙම කවි පදයෙන් මතුවන භාවය සහ රසය දක්වන්න.

1.භාවය :- ............................................................ 2. රසය ..........................................................................

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

52 | S | II

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

**Third Term Test - Grade 13 - 2018**

විභාග අංකය .................................. නර්තනය (දේශීය) II කාලය පැය තුනයි

වැදගත්

පළමුවන කොටසින් ප්‍රශ්න දෙකක් ද, II, III, හා IV කොටස්වලින් එක් ප්‍රශ්නය බැගින් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
සෑම ප්‍රශ්නයකටම (I) කොටසට ලකුණු 06 ක් ද, (II) කොටසට ලකුණු 06 ක් ද, (III) කොටසට ලකුණු 08 ක් ද වශයෙන් මුළු ලකුණු 20 ක් හිමි වේ.

## I කොටස

01. පහත සඳහන් බෙර පද අතරින් ඔබ උගත් සම්ප්‍රදායට අයත් බෙර පදය තෝරා, නියමිත තාලයට ප්‍රස්තාර කරන්න.
   i. දොං තකු දොං ජිං ගත් තත් ජිං තත් ජිං තක තරිකිට
      ගුග් ගුද ගුග් ගුද ගතිගත - ගත් ගත ගත්ගත ගදිගත
      ජෙංකිට ජෙං කිට කිටිතක - තත් කිට තත්කිට තරිකිට
   ii. 'සුරපති වන්නමේ කවියක් අදාල තිතට ප්‍රස්ථාර කරන්න.
   iii. ගොග් ගොග් ජිං ජිංගත වට්ටමට අයත් දෙවන අඩව්ව නියමිත තිතට ප්‍රස්ථාර කරන්න.

02. දේශීය ශාන්ති කර්ම ශාස්ත්‍රීය නර්තන, ගායන, වාදන අංගවලින් පරිපූර්ණව ඇත.
   i. කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ එන කොහොඹහැල්ල සහ අස්නෙ නර්තන අංග දෙක ඇසුරින් ඉහත පාඨය සනාථ කරන්න.
   ii. ශාන්ති කර්මවල අන්තර්ගත වාදන අවස්ථා නිදසුන් දෙමින් විස්තර කරන්න.
   iii. බෙර පද හා කවි ගායනා මගින් චරිත නිරූපණය සිදු කරන ආකාරය රටයකුමෙහි නානුමුරය ඇසුරින් විග්‍රහ කරන්න.

03. දේශීය ශාන්ති කර්ම පැරණි ජන ජීවිතය හා බැඳී පැවතුණු විචිත්‍රවත් සංස්කෘතිකාංගයකි.
   i. දේශීය ශාන්තිකර්ම පැවැත්වීමේදී සමාජ සහයෝගය ලැබෙන ආකාරය පිළිබඳ ඇගයීමක් කරන්න.
   ii. සිංහල සැරසිලි කලාවෙන් ශාන්තිකර්ම ඔප්නැංවී ඇති ආකාරය දොවොල් මඩුවේ සැරසිලි ඇසුරින් විමසන්න.
   iii. ඇදහිලි හා විශ්වාස ශාන්තිකර්මවල පැවැත්ම ඉවහල්වන ආකාරය කොහොඹා කංකාරි උපත් කථාව ඇසුරින් සාකච්ඡා කරන්න.

## II කොටස

04. ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට අද්‍යතනය දක්වාම දේශීය නර්තන කලාව පිළිබඳ තොරතුරු ලබා ගැනීමේදී විවිධ මූලාශ්‍ර වැදගත් වේ.
   i. අනුරාධපුර යුගයට අයත් සෙල්ලිපි දෙකක් දක්වා එකල නර්තන කලාව පැවති ආකාරය විමසන්න.
   ii. රවීන්ද්‍රනාත් තාගෝර්තුමාගේ ආගමනයත් සමග නර්තන කලාවෙහි ඇති වූ ප්‍රබෝධය පිළිබඳ කරුණු දක්වන්න.
   iii. දේශීය නර්තන කලාවට භාරතීය ආභාසය ලැබුණු බවට සංදේශ කාව්‍ය උදාහරණයට ගෙන කරුණු දක්වන්න.

05. i. දේශීය ජන නැටුම ජන ජීවිතය හා බැඳී පැවතුණි..... මෙම කියමන ගැමි නැටුම් දෙකකින් උදාහරණ දක්වමින් සනාථ කරන්න.

ii. කෝලම් හා සොකරි නාටකවල රංග කාර්යය සඳහා සාම්ප්‍රදායික නර්තනයන්ගෙන් ලැබී ඇති පිටුවහල පිළිබඳ විමසීමක් කරන්න.

iii. ප්‍රාථමික ලක්ෂණ විදහා දැක්වෙන සොකරි හා කෝලම් රඟ මඬලෙහි භාවිත ශිල්ප ක්‍රම පිළිබඳ සාකච්චා කරන්න.

## iii කොටස

06. පහත සඳහන් වගුව ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| (අ) කොටස | (ආ) කොටස | (ඉ) කොටස |
|---|---|---|
| පදම් | මෘදංගය | රවීන්ද්‍රනාත් තාගෝර් |
| ආමද් | චෙන්ඩා | උයද ශංකර් |
| රාස්ලීලා | පුංගි | වල්ලතෝල් නාරායන මෙනන් |
| සලාම් | එඩැක්ක | මීනාක්ෂි සුන්දරම් පිල්ලෙයි |

i. (අ) කොටස - මෙම කොටසෙහි ඇතුළත් දක්ෂිණ භාරතීය නර්තනාංගය නම් කර එම නර්තන අංගය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

ii.(ආ) කොටස - මෙම කොටසෙහි ඇතුළත් උත්තර භාරතීය වාද්‍ය භාණ්ඩය නම් කර එය අයත් නර්තන සම්ප්‍රදාය බිහිවීමෙහිලා බලපෑ ආගමික පසුබිම පරීක්ෂා කරන්න.

iii. (ඉ) කොටස - මෙම කොටසෙහි සඳහන් ශිල්පීන් අතුරින් භාරත නර්තන සම්ප්‍රදාය වර්ධනයෙහි පුරෝගාමීව කටයුතු කළ ශිල්පීයෙකු පිළිබඳ විස්තර කරන්න.

07. i. දේශීය මුද්‍රා නාට්‍ය බිහිවීමෙහිලා භාරතීය නෘත්‍ය නාටකවලින් ලැබුනු ආභාසය පිළිබඳ කරුණු දක්වන්න.

ii. 14 වන ලුවී, ගලීනා උලනෝවා, ජීන් ජෝර්ජ් නෝර්වේ, යන අය අතුරින් එක් අයෙකුගෙන් බටහිර බැලේ රංග කලාවට සිදු වූ සේවය අගයන්න.

iii. නෙළුම් පොකුණ රඟහල පදනම් කරගෙන නිර්මාණය වූ නූතන මුද්‍රා නාට්‍යයන්හි නව ප්‍රවණතා පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

## IV කොටස

08. දේශීය නර්තන කලාව විවිධ මංපෙත් ඔස්සේ නව්‍යකරණය වෙමින් පවතී.

i. ගෝලීයකරණය තුළින් නර්තනයේ සිදු වූ ප්‍රවණතා පිළිබඳ අදහස් දක්වමින් ඇගයීමක් කරන්න.

ii. අධ්‍යාපනික විෂයයක් බවට පත්වීම මගින් නර්තන කලාවට ලැබුනු වටිනාකම් පිළිබඳ විමසීමක් කරන්න.

iii. නර්තන කලාවෙහි ජනප්‍රියත්වයට විද්‍යුත් මාධ්‍යයන්ගෙන් ලැබෙන අනුග්‍රහය පිළිබඳ අදහස් දක්වන්න.

09. නිර්මාණ නර්තන මෙන්ම සාම්ප්‍රදායික නර්තන අංග ද ප්‍රසංග වේදිකාව තුළ බහුලව දක්නට ලැබේ.

i. නව නර්තන ප්‍රවනතා හමුවේ සාම්ප්‍රදායික නර්තනයට හිමි තැන පිළිබඳව ඔබේ අදහස් දක්වන්න.

ii. නර්තන අධ්‍යාපනයේ මුඛ්‍ය පරමාර්ථය ආකල්ප සංවර්ධනය වුවත් අද්‍යතන නර්තන තරගාවලීන් මගින් එය කොතෙක් දුරට සිදුවේද? විමසීමක යෙදෙන්න.

iii. අයදතන නර්තන ප්‍රසංගවල ගීත හා නර්තන සුසංයෝගයේ දී යොදා ගැනෙන සංචලනවල ඖචිත්‍යභාවය සාකච්ඡා කරන්න.

| **13 ශ්‍රේණිය** | **නර්තනය I** | **පිළිතුරු පත්‍රය** |
|---|---|---|

## I කොටස

1. 1
2. 4
3. 3
4. 2
5. 1
6. 4
7. 4
8. 5
9. 5
10. 2
11. 4
12. 2
13. 3
14. 5
15. 5
16. 2
17. 1
18. 2
19. 1
20. 2
21. 3
22. 1
23. 3
24. 4
25. 5
26. කඩතුරා
27. පෙනකොම්බා
28. කේ.ඇස්. ප්‍රනාන්දු
29. රංග වින්‍යාසය
30. කෝලම්
31. උඩැක්කිය
32. කථක්
33. ගොයම් නැටුම
34. ගොග් ගොග් ජිං ජිං ගත වට්ටම
35. අණ බෙර / පතික්කල
36. 1. හරත 2. කථකලි
37. 1. රුසියාව 2. ප්‍රංශය
38. 1. ඇත් පහන 2. පොළොන්නරුව
39. 1. නල දමයන්ති 2. චිත්‍රසේන ඩයස් මහතා
40. 1. මෘදංගය 2. පුංග්
41. 1. සාරාංගිය 2. කථක්
42. 1. මොණර නිල 2. රතුවන් දම් / මැජෙන්ටා
43. 1. කැලිකට්හි රාජා ජමෝරින් 2. කොට්ටාක්කාර තාම්පුරන්
44. 1. සමන 2. දීපන
45. 1. රටයකුම 2. කොහොඹා කංකාරිය
46. 1. නට්ටුවාර් 2. ආසන්
47. 1. චිත්‍රාංගදා 2. සීතාහරණය
48. 1. කුවේණි අස්න 2. සිහබා අස්න
49. 1. පුද්ගල අවකාශය 2. පොදු අවකාශය
50. 1. ජුගුප්සා 2. පිළිකුල

## II පත්‍රය - I කොටස

1. (i)

| | ^1 2 | /1 2 3 4 | ^1 2 | /1 2 3 4 |
|---|---|---|---|---|
| උඩරට | ද්‍රෙං තත් | දොං ජිං ගත් ගත් | ජිං තත් | ජිං තක තරි කිට |
| පහතරට | ගුඳ් ඳද | ගුග් ඳදු ගුඹ් ගුත | ගුත් ගුත | ගුත් ගුත ගුදි ගුත |
| සබරගමු | ජෙං කිට | ජෙං තක කිට් තක | තත් කිට | තත් කිට තරි කිට |

නිවැරදි සංකේත භාවිතය - 2
නිවැරදි පද ප්‍රස්තාර කිරීම - 4

ලකුණු 06 යි.

(ii)

| ^1 2 3 | /1 2 3 4 | ^1 2 3 | /1 2 3 4 |
|---|---|---|---|
| ශ්‍රී යා - | මුන් - ප තී | උ ම ග | හා - දෙවි - |
| + නැනි ච | වි ලි සෝ - | ක දෙන් - | ශු සු රි දු |
| + + + | දෙ - වෙ - | ස - - | වේ - - - |
| - - - | ලා - - - | ග - - | නි - - - |

නිවැරදි සංකේත භාවිතය - 2

නිවැරදිව සම්පූර්ණ කවිය පුස්තාරගත කිරීම - 4

ලකුණු 06 යි.

(iii)

| ^1 2 | ^1 2 | ^1 2 | /1 2 3 4 | ^1 2 | ^1 2 | ^1 2 | /1 2 3 4 |
|---|---|---|---|---|---|---|---|
| රේ හිං | තත තත | ජිජි | ජි ජි තද | තක තක | තරි කිට | තම් - | ජිත් - තම් - |
| ග ජි | ත කු | ත ක | තෙ හිං - - | තෙ* හිං | ත කු | දුත් - | තා - - - |
| දොං ගඩ | තරි කිට | ජිත් - | තා - - - | ග ත | ගොං ගො | ත ක | දො මි කි ට |
| දොං ගඩ | තරි කිට | ජිත් - | තා - - - | | | | |

නිවැරදි සංකේත භාවිතය - 2

සම්පූර්ණ නිවැරදි පුස්තාරය - 6 - ලකුණු 08

මුළු ලකුණු 20 යි

02. (i) * නියමිත පද කොටස් ඇති බව.
* නියමිත ගායනා සහ නියමිත නාද මාලාවක් ඇතිබව.
* ඉදිරිපත් කිරීමේ අනුක්‍රමික පිළිවෙළක් ඇති බව.
* නියමිත අංගහාර දැක්විය යුතු බව.
* අදාල රංග භාණ්ඩ භාවිතා කරන බව.
* මේවා කාලාන්තරයක් නොවෙනස්ව පවත්නා බව
* ශාස්ත්‍රීය බව රැකෙන අයුරින් ගුරු ඇසුරින් ඉගෙනගන්නා බව ආදී කරුණු අදාළ නර්තන අංග දෙක ඇසුරින් සනාථ කර තිබීම. (ලකුණු 6)

(ii) * මඟුල් බෙර. යහන් බෙර, පිං බෙර, අත්‍යා බෙර, දැකුම් අත් වන්දමානම්.. ආදී සුවිශේෂී වාදන අවස්ථාව ඇතිබව. ඒ ඒ සම්ප්‍රදායන්හි අනන්‍ය ලක්ෂණ දැක්වෙන පරිදි නියමිත ශාස්ත්‍රීය පද කොටස් සහ වාදන විලාස දැක්වෙන බව. (ලකුණු 6)

(iii) * චරිත නිරූපණයේදී යකැදුරා කාන්තා වෙස් ගන්නා බව.
* චරිත ලක්ෂණ නිරූපණය සිදු කරන ආකාරයට බෙර පද භාවිත කරන බව.
* නානු මුරයෙහි අවස්ථා දොළහක් නිරූපණය කරන බව.
* එම එක් එක් අවස්ථාවක් සඳහා වෙන වෙනම කවි ගායනා කරමින් ඊට අදාළව නිරූපණයෙහි යෙදෙන බව.
* මෙම කවි සහ බෙර පදවලට අදාළව කාලානුකූල සහ ප්‍රකාශනාත්මක චලන භාවිත කරන බව. බෙර පද, කවි උදාහරණ ලෙස දක්වමින් විග්‍රහ කර තිබීම. (ලකුණු 8) (මුළු ලකුණු 20)

03. (i) අගසස් වෙන් කිරීම, පොල් බුලතෙ යාමේ සිට ගමේ සියළු දෙනාම ශාන්තිකර්මය පැවැත්වීම සඳහා දින නියම කොට කටයුතු සැලසුම් කරන අතර එකම පරමාර්ථයක් උදෙසා සියළු දෙනා සාමූහිකව කැප වන බව.
* අන්‍යෝන්‍ය සුහදත්වයෙන්, නායකත්වය ගරු කරමින් සාමූහිකව කටයුතු කරන බව.
* එකිනෙකට හැකි ආකාරයෙන් අවශ්‍ය ද්‍රව්‍ය එක්රැස් කරගන්නා බව.
* සියළු දෙනා තම ශ්‍රමයෙන් ද දායක වන බව.
* නිසිම භේදයකින් තොරව එම අවස්ථාවට සහභාගී වන බව ආදී කරුණු දක්වමින් පිළිතුරු සපයා තිබීම. (ලකුණු 6යි)

(ii) ස්වාභාවික පරිසරයෙන් ලබාගන්නා අමු ද්‍රව්‍ය කලාත්මකව හසුරවමින් ශාන්ති කර්ම තුළ ඇති (යහන්, වීදි, අයිල, මල් පැල... යනාදී) සැරසි සකස් කර ඇති බව සිංහල සැරසිලිවල එන ගොක් කලාව, කැටයම් රූකම් මේ සඳහා යොදාගෙන ඇති බව. ආභරණ සකස් කිරීමේදී ද මෙම සැලකිලි දැකිය හැකි බව උදාහරණ දක්වමින් විමසුමක් කර තිබීම. (ලකුණු 6)

(iii) කොහොඹා කංකාරිය තුළ යකුන්, දෙවියන්, මළවුන් ඇදහීම දැකිය හැකි බව.
* හදි හූනියම් පිළිබඳ මිනිසුන් තුළ විශ්වාස (දිවි දෝෂය)
* දෙවියන් මළවුන් සතුටු කිරීමට සෙත් හාන්තියක් සිදුවන බව (කොහොඹා දෙවි ඇතුළු දෙවිවරු පිදීම)
* ඊශ්වර, රාහු ආදී දේව මණ්ඩලය කෙරෙහි ඇති විශ්වාස පොරොන්දු කඩ කිරීම, නෑදෑ කුල ගොත්‍ර නොසලකා හැරීම ආදිය තුළින් යහ පැවැත්මට හානිවනවා මෙන්ම විනාශයට ද හේතුවන බව ආදී විශ්වාස හා ඇදහිලි ශාන්තිකර්ම වල පැවැත්මට ඉවහල්වන බව සාකච්ඡා කරමින් කරුණු දක්වා තිබීම.
(ලකුණු 8) (මුළු ලකුණු 20)

## II කොටස

04. (i) සැස්සේරුව සහ කොරවග්ගල යන ලිපිවල සඳහන් සාධක තිබීම.
* ඒ අනුව ඒක නර්තනය සඳහාම වෙන් වූ පරම්පරාවක් සිටි බව.
* ඔවුන් ආර්ථික හා සමාජීය පිළිගැනීමට ලක්ව සිටි බව.
* ඒ සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබෙන්නට ඇති බව.
ආදී කරුණු දක්වා තිබීමට (ලකුණු 6)

(ii) * 1934 දී නෘත්‍ය නාට්‍ය කණ්ඩායමක් සමඟ පැමිණීම
* ශාප් මෝචන් රඟ දැක්වීම.
* ශ්‍රී ලාංකීය කලාකරුවන් භාරතීය ශිෂ්‍යත්ව ලැබීම.
* ඒ අනුව දේශීය මුද්‍රා නාට්‍ය කලාවක් බිහිවීම.
* කාන්තා ප්‍රබෝධයක් (චන්ද්‍ර ලේඛා, මේරියන්ස් ද සොයිසා) ඇතිවීම.
ආදී කරුණු දක්වා තිබීම. (ලකුණු 6)

(iii) * ගම්පල සහ කෝට්ටේ යුගයන්හිදී භාරතීය ආභාෂය නර්තන කලාවට ලැබී ඇති බව.
* ස්ත්‍රීන් නර්තනයෙහි යෙදුනු බව,
* භාරතීය අංග හාර, රංග වස්ත්‍රාභරණ, අංග රචනා හා වේෂ නිරූපණ වාද්‍ය භාණ්ඩ ආදී...
කරුණු දැක්වෙන පරිදි කවි උදාහරණයට ගනිමින් ලියා තිබීම. (ලකුණු 8) (මුළු ලකුණු 20)

05. (i) ජන ජීවිතයේ සෑම අවස්ථාවකදීම (වෘත්තීන්වල නියැලෙන අතර, විනෝද අවස්ථාවන්හිදී, විශේෂ අවස්ථාවන්හිදී) ජන නැටුම බැඳී පැවතුණු බව, එමෙන්ම දුක, කාන්සිය, විඩාව, සතුට යනාදී සෑම අවස්ථාවකදීමත් ජන නැටුම් ගී සම්බන්ධව පැවති බව උදාහරණ දක්වමින් සනාථ කර තිබීම.
(ලකුණු 6)

(ii) සාම්ප්‍රදායික නර්තනයන්හි එන බෙර පද, නර්තන අංග වාද්‍ය භාණ්ඩ යොදා ගැනීම (උදා : කෝලම්, ශුද්ධ මාත්‍රා පද, මුගුරු පද, දෙතාලය) (සොකරි - උඩරට මූලික සරඹ පද, ගමන් පද, කෙටි කස්තිරම් සහ තාල ලක්ෂණ භාවිතය) ආදී කරුණු ඇසුරින් විමසීමක් කර තිබීම. (ලකුණු 6)

(iii) කවාකාර රඟ මඬලක් බව සොකරි සඳහා කමත රඟමඬල ලෙස යොදා ගන්නා බව. එහිදී ප්‍රේක්ෂකාගාරය වෙන් කිරීම සඳහා ගොක්රැහැන් සහ ලණු ඇඳ සකසා ගන්නා බව. ආලෝකය සඳහා වටේට පොල් පන්දම් යොදා ගැනීම. වංගෙඩිය මත ලන්තෑරුම භාවිතය, රංග ප්‍රවේශය සඳහා වෙස් අත්ත භාවිතය... ආදී කරුණු දක්වා සාකච්ඡා කර තිබීම. (ලකුණු 8)
(මුළු ලකුණු 20)

06. (i) **අ කොටස - පදය -**
* භාරත නාට්‍ය සංදර්ශනය පස්වන අංගය ලෙස විවේක කාලයෙන් පසු රඟ දැක්වෙන බව
* භක්තිය දනවන, නෘත්‍ය ලක්ෂණ සහිත නර්තන අංගයක් බව.
* විශේෂිත පද කොටස් (උදා : ක්ෂේතඥ පද, අෂ්ඨ ජාවලී, කීර්තනම් ආදිය) භාවිතා වන බව
* ශිල්පීන් පිළිබඳ දක්වා තිබම. (ලකුණු 6)

(ii) **'ආ' කොටස - 'පුංග්' යනුවෙන් නම්කර තිබීම.**
* මණිපුරි හා සම්බන්ධ කථා පුවත් (උදා : මණිපුරි දේශය සම්බන්ධ කථා සහ ශිව පාර්වතී සම්බන්ධ කථා) ඇසුරින් ආගමික පසුබිම පරීක්ෂා කර කරුණු දක්වා තිබීම. (ලකුණු 6)

(iii) **'ඉ' කොටස - මීනාක්ෂි සුන්දරම් පිල්ලෙයි**
* පණ්ඩනාලූර් පෙළපතේ ප්‍රවීණයෙකු බව.
* පොන්නයියාගේ මුණුබුරෙකු බව.
* දාසි අට්ටම් භරත නාට්‍යයම් ලෙස සකස් කර ඉදිරිපත් කළ බව.
* නාට්ටුහාර්වරුන් කැඳවා සම්මේලන පැවැත්වූ බව
ආදී කරුණු දක්වමින් භරත නාට්‍යයෙහි පුරෝගාමීව කටයුතු කළ බව කරුණු දක්වා තිබීම.
(ලකුණු 8) (මුළු ලකුණු 20)

07. (i) * රවීන්ද්‍රනාත් තාගෝර් තුමාගේ පැමිණීමෙන් දේශීය නර්තන ශිල්පීන් තුළ නෘත්‍ය නාටක කෙරෙහි ප්‍රබෝධයක් ඇතිවීම.
* ශාන්තිදේව ඝෝෂ් විසින් ලංකාවේ නිෂ්පාදිත නෘත්‍ය නායකවලට සම්බන්ධවකටයුතු කිරීම.
* ශිෂ්‍යත්ව ලැබීම.
* ඉන්දීය ශිෂ්‍යත්ව ලැබීම තුළින් භාරතීය නර්තනයන් හැදෑරීම.
* මෙම ශිල්පීන් විසින්භාරතීය ලක්ෂණ සහිතව (භාරතීය කතා පුවත්, කථකලී , මණිපුරී නර්තන අංග අංගරචනා ක්‍රම, සංගීතය, රංග වස්ත්‍ර...) මෙරට මුද්‍රා නාට්‍යකලාව බිහි කිරීමට මුල්වූ බව. (ලකුණු 6)

(ii) * බටහිර බැලේ සඳහා එක් ශිල්පියෙකුගෙන් සිදු වූ සේවය පිළිබඳ ඇගයීමක් කර තිබීම.
කරුණු 4ක් වත් ඉදිරිපත් කර ඇත්නම් ................. (ලකුණු 6)

(iii) *ආරියරත්න ඇතුගල මහතාගේ 'මහ සමයම' , මහාචාර්ය ආරියරත්න කළුආරච්චි මහතාගේ 'තුන්බිය' ,... වැනි නිර්මාණ නෙළුම්පොකුණ රඟහල පදනම් කරගෙන බිහිවීම.
* නවීන තාක්ෂණ ශිල්පක්‍රම භාවිතය (ජවනිකා මාරුවන විට වේදිකාවේ ඉහළ පහළ යන තල භාවිතය, විශාල පසුතල නිර්මාණ භාවිතය, රංග කාර්ය සඳහා කේබල් භාවිතය විවිධ අවස්ථා මතුකර දැක්වීම සඳහා ආලෝක ශිල්ප ක්‍රම සුවිශේෂීව භාවිතා කිරීම.)
* විශාල ශිල්පීන් පිරිසක් එකවර රංගකාර්යයෙහි යෙදවීම.
යනාදී කරුණු පිළිබඳ අදහස් දක්වා ඇත්නම් (ලකුණු 8) (මුළු ලකුණු 20)

## IV කොටස

08. (i) * ගෝලීයකරණය වීමනිසා විවිධ රටවල නර්තන ශෛලීන් සජීවීම දැකබලා ගැනීමට හැකිවීම.
* විවිධ නර්තන ශෛලීන්ගේ සංචලන, සංගීතය, වාද්‍ය භාණ්ඩ, රංග වස්ත්‍ර, අංගරචනය... ආදී ආභාෂයෙන් දේශීය නර්තන කලාව පෝෂණය වීම ඇති ආකාරය පිළිබඳ කරුණු දක්වා ඇත්නම් (ලකුණු 6)

(ii) * පිරිසකට සීමාවී තිබූ නර්තන කලාව අන් අයටද හැදෑරීමට අවස්ථාව ලැබීම තුළින් ඒ සඳහා යොමු වූ පිරිස වැඩිවීම හා එමගින් නර්තනයට වටිනාකමක් එක්වීම.
* විවිධ උගතුන්ගේ අවධානය නර්තන කලාවට යොමුවීම හා ග්‍රන්ථකරණයේ යෙදීම තුළින්නර්තන සාහිත්‍යයක් බිහිවීම.
* පාසල් අධ්‍යාපනයේ සිට විශ්ලවිද්‍යාල අධ්‍යාපනය දක්වා නර්තන විෂය පරාසය පුළුල්වීම.
* නර්තනකලාව පිළිබඳ පර්යේෂණ කෘති බිහිවීම.
* පිළිගත් වෘත්තීය අවස්ථා සම්පාදනය වීම..
ආදී කරුණු මගින් විමසීමක් කර ඇත්නම් (ලකුණු 6)

(iii) * රූපවාහිනී රියලිටි වැඩසටහන් තුළින් ප්‍රේක්ෂකයන් විශාල පිරිසක් බිහිවීම.
* ප්‍රාසාංගික බව, ගුණාත්මක බව, නිර්මාණශීලී බව ඉහළ මට්ටමක පවත්වා ගනිමින් නිර්මාණ ඉදිරිපත් කිරීමට ගන්නා උත්සාහය නිසා ප්‍රේක්ෂක ආකර්ෂණය දිනා ගැනීම.
* සාම්ප්‍රදායික අංග පවා ප්‍රාසාංගිකව ඉදිරිපත් කිරීම නිසා එම නර්තන අංගද ජනප්‍රියත්වයට පත්වීම... යනාදී කරුණු දක්වා ඇත්නම් (ලකුණු 8) (මුළු ලකුණු 20)

09. (i) ගීත නර්තන, බටහිර ආභාෂය සහිත විවිධ නර්තන බිහිවීමේ ප්‍රවණතාව නිසා සාම්ප්‍රදායික නර්තන අව භාවිතය, නොසලකා හැරීම.
* තරඟකාරීව එම නර්තන හා සාම්ප්‍රදායික නර්තන අංග ඉදිරිපත්කිරීමට පෙළඹීම තුළින් නර්තනයෙහි පැවති සාම්ප්‍රදායික ලක්ෂණ ඒ හා බැඳුණු සාර ධර්ම ශිල්ප ක්‍රම හර පද්ධතීන් ගිලිහීම. යනාදී කරුණු පිළිබඳ අදහස් දක්වා ඇත්නම් (ලකුණු 6)

(ii) නර්තනයේ මුඛ්‍ය පරමාර්ථය ශාරීරික හා මානසික ස්වස්තතාවයි. දැණුම, ආකල්ප, කුසලතා සංවර්ධනයෙහි ආකල්ප සංවර්ධනයෙහි මූලික ස්ථානය හිමිවන්නේ සෞන්දර්ය අධ්‍යාපනයටයි. නමුත් අද්‍යතන නර්තන තරගාවලීන් මගින් එය ඉටුවන්නේ අල්ප වශයෙනි.
* බොහෝ විට පරාජය භාර නොගැනීම. කලහකාරී හැසිරීම්, අන් නිර්මාණ අගය නොකිරීම දැකිය හැක. යනාදී කරුණු දක්වමින් විමසීමක්කර තිබීම. (ලකුණු 6)

(iii) * අද්‍යතන වේදිකාවේ සංගීත ප්‍රසංගවල ගීතවලට නර්තන යොදා ගැනීමේදී ගීතයන් අර්ථය නොසලකා හැරීම. * නොගැලපෙන චලන භාවිතය (අඟ පසඟ සෙලවීම, තාලයට හා රිද්මයට පමණක් අවධානය යොමු කිරීම. ආදී කරුණු සාකච්ඡා කිරීම
(ලකුණු 8) (මුළු ලකුණු 20)